ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்
LAND COMMISSIONER GENERAL'S DEPARTMENT

"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය, 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
"மிஹிகதமெதுர", காணிச் செயலகம், 1200/6, ரஜமல்வத்த வீதி, பத்தரமுல்ல
"Mihikatha Medura", Land Secretariat, 1200/6, Rajamalwatta Road, Battaramulla.

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>MY NO | 4/1/චක්‍රලේඛ | ඔබේ අංකය<br>உமது இல<br>YOUR NO | | දිනය<br>திகதி<br>DATE | 2016.02. 25 |

චක්‍රලේඛ අංක : 2015/01 (II)

සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්,
නියෝජ්‍ය /සහකාර ඉඩම් කොමසාරිස්වරුන් (අන්තර් පළාත්).

ළාත් ඉඩම් කොමසාරිස්
දකුණු පළාත් සභාව
09 MAR 2016
ගාල්ල.

**2015 අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම**

**නාගරික ප්‍රදේශවල පදිංචිය සඳහා ඉඩම් ලබා දීමේ දී සහන ස...**

ඉහත මැයෙන් යුත් මගේ සමාංක හා 2015.01.01 දිනැති අංක 2015/01 දරණ චක්‍රලේඛය හා සබැඳේ.

02. එහි 04 වන ඡේදය පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලබන බව කාරුණිකව දැනුම් දෙන අතර ඒ අනුව කටයුතු කිරීමට සටහන් කර ගන්නා ලෙස වැඩිදුරටත් දන්වා සිටිමි.

" එසේ තෝරා ගන්නා ලද දින සිට 2015/01 දරණ චක්‍රලේඛය නිකුත් කරන ලද 2015.01.01 දින දක්වා මෙවැනි ඉඩම් සඳහා අදාල වන හිඟ බදු මුදල් අය කරනු නොලබන බව ද කාරුණිකව සලකන්න. මෙහිදී නියමිත වාර මුදල ද කපා හරිනු ලබන බව සලකන්න. එහෙත් අනවසර පදනම මත තෝරා ගනු ලැබූ ඉඩම්වලට අදාලව අය කරනු ලබන දඩ මුදල කපා නොහරින බව ද සැලකිය යුතුයි. මෙම චක්‍රලේඛය ක්‍රියාත්මක වන දිනය වන විට ගරු අමාත්‍යතුමාගේ අනුමැතිය ලබාගෙන ඇති එහෙත් දීර්ඝ කාලීන බදුකරයක් නිකුත් කර නොමැති මෙවැනි ඉඩම්වලට ද හිඟ බදු අය නොකිරීමේ සහනය අදාල වේ. එහෙත් ඒ වන විටත් එවැනි හිඟ බදු මුදලක් ගෙවා ඇත්නම් එම මුදල ඉදිරියට අය විය යුතු බදු මුදල් වෙනුවෙන් හිලව් කිරීමට පුලුවන. මෙම චක්‍රලේඛය ක්‍රියාත්මක වන දිනයෙන් පසුව පුද්ගලයින් තෝරා ගනු ලැබූ ඉඩම් සම්බන්ධයෙන් මෙම හිඟ බදු අය නොකිරීමේ සහනය අදාල නොවන බව සැලකිය යුතුයි."

ආර්.පී.ආර්. රාජපක්ෂ,
ඉඩම් කොමසාරිස් ජනරාල්.

පිටපත්:

| | | | |
|---|---|---|---|
| 1. | ජනාධිපති ලේකම් | - | කාරුණික දැ.ගැ.පි. |
| 2. | ලේකම් - ඉඩම් අමාත්‍යාංශය | - | කාරුණික දැ.ගැ.පි. |
| 3. | ලේකම් - මුදල් අමාත්‍යාංශය | - | කාරුණික දැ.ගැ.පි. |
| 4. | ලේකම් - ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | - | කාරුණික දැ.ගැ.පි. |
| 5. | අධ්‍යක්ෂ ජනරාල් - ශ්‍රී ලංකා මහවැලි සංවර්ධන අධිකාරිය | - | අ. ක. ස. |
| 6. | සියලුම දිසාපතිවරුන් | - | කාරුණික දැ.ගැ.පි. |
| 7. | සියලුම පළාත් ඉඩම් කොමසාරිස්වරුන් | - | අ. ක. ස. |

දුරකථනය / தொலைபேசி 011-2797400   ෆැක්ස් / பெக்ஸ் 011-[illegible]   වෙබ් ලිපිනය   ඊමේල්

වන සම්පත් හා පරිසර අමාත්‍යාංශය
සම්පත්පාය,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.
2001.08.10

අමාත්‍යාංශ චක්‍රලේඛ අංක. 05/2001

වන සංරක්ෂක

සියලුම දිස්ත්‍රික් ලේකම්වරු

සියලුම ප්‍රාදේශීය ලේකම්වරු

රජයට අයත් සියලුම අවශේෂ කැලෑ කළමනාකරණය හා පාලනය කිරීම සඳහා
වන සංරක්ෂකට පැවරීම.

රජයේ අවශේෂ කැලෑ කළමනාකරණය යන මැයෙන් යුතු මගේ අංක. 02/02/03/3011 හා 1998/07/01 දිනැති අංක. 05/98 දරණ චක්‍රලේඛය මෙයින් අවලංගු කරන අතර, වහාම ක්‍රියාත්මක වන පරිදි මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

02) දැනට ශ්‍රී ලංකාවේ තිබෙන ස්වාභාවික කැලෑ ප්‍රධාන වශයෙන් ආයතන තුනක් මගින් පාලනය කෙරේ. එනම් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වේ. රක්ෂිත වනාන්තර, යෝජිත රක්ෂිත වනාන්තර හා ඇතැම් අවශේෂ කැලෑ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් පාලනය කරනු ලබන අතර, දැඩි ස්වාභාවික රක්ෂිත, වන උද්‍යාන, වනමං, අභය භූමි සහ ස්වාභාවික රක්ෂිත, වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් පාලනය කෙරේ. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව හෝ වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් පාලනය නොකරනු ලබන කැලෑ රජයේ අවශේෂ කැලෑ වශයෙන් ප්‍රාදේශීය ලේකම්වරුන් යටතේ පාලනය වේ.

03) දැනට දිස්ත්‍රික් ලේකම්/ප්‍රාදේශීය ලේකම් යටතේ පාලනය වන සියලුම අවශේෂ කැලෑ ජාතික වන ප්‍රතිපත්තියට අදාලව කළමනාකරණය කිරීම, වැඩි දියුණු කිරීම හා ආරක්ෂා කිරීම සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට පවරනු ලැබේ. (එසේවුවද අවශ්‍ය අවස්ථාවලදී දිස්ත්‍රික් ලේකම්වරුන්ට/දිසාපතිවරුන්ට හා ප්‍රාදේශීය ලේකම්වරුන්ට මෙම කැලෑ වල ආරක්ෂාව සඳහා, වන ආඥාපනත යටතේ පවරා දී ඇති බලතල ක්‍රියාත්මක කිරීමට මින් බාධාවක් නොවේ.)

04) රජයේ අවශේෂ කැලෑ කිසියම් වෙනත් පරිහරණ කටයුත්තක් සඳහා යොදා ගැනීමට අවශ්‍ය වන්නේ නම්, ඒ සම්බන්ධ ව්‍යාපෘති යෝජනාව වන සම්පත් හා පරිසර අමාත්‍යාංශයේ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් යුත් අන්තර් අමාත්‍යාංශ කමිටුවට ඉදිරිපත් කර අනුමැතිය ලබාගත යුතු වේ. එම අන්තර් අමාත්‍යාංශ කමිටුව වන සම්පත්, ඉඩම හා වන ජීවී යන විෂයය ක්ෂේත්‍රයන්ට අදාල අමාත්‍යාංශවල නියෝජිතයින්ගෙන් සමන්විත වේ. ඉඩම් ලබා ගැනීම සම්බන්ධයෙන් වූ ව්‍යාපෘති යෝජනාව පළමුව දිස්ත්‍රික ඉඩම් පරිහරණ කමිටුවට ඉදිරිපත් කර, ඉන්පසු එම නිර්දේශය වන සංරක්ෂක මගින් ඔහුගේ නිර්දේශ සහිතව අන්තර් අමාත්‍යාංශ කමිටුව වෙත යොමු කළ යුතුය. මෙම කමිටුව මගින් අධ්‍යයනය කරනු ලබන එම යෝජනාව අනුමත කරන්නේ නම් පමණක් ජාතික පාරිසරික පනත යටතේ පරිසර ඇගයීමකට ලක් කිරීම සඳහා එම යෝජනාව යෝජකයා වෙත නැවත යොමු කරනු ලැබේ. පරිසර ඇගයීමක් අවශ්‍ය වන අවස්ථාවලදී එම පරිසර ඇගයීම් සහතිකය යෝජකයා විසින් ලබාගෙන මා වෙත ඉදිරිපත් කළයුතු වේ. අදාල නිර්දේශ අනුව ඉඩම ලබාදීම පිළිබඳව අනුමැතිය මා විසින් දෙනු ලබන අතර, ඉන් අනතුරුව අවස්ථාවට උචිත පරිදි අදාල පාර්ශවයට සුදුසු කොන්දේසි මත ඉඩම ලබාදීම සඳහා යෝජිත ඉඩම ඉඩම් කොමසාරිස් වෙත නිදහස් කරනු ලැබේ.